# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
*Web: www.elections.gov.lk* *e-mail: info@slelections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய*(10107)*


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/LAE/2025/06<br>எனது இல. : | ඔබේ අංකය :<br>உமது இல.: | දිනය : 2025.03.11<br>திகதி : |

**චක්‍රලේඛ අංක - LAE/2025-08**

තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්,
ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025**
**ප්‍රචාරක කාර්යාල පිහිටුවීම**

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිවේදිත ප්‍රචාරක කාර්යාල පිහිටුවීම හා පවත්වාගෙන යාමේ දී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීම සඳහා මෙම ලිපිය නිකුත් කරනු ලැබේ.

02. 2017 අංක 31 ක දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) පක්ෂ/ අපේක්ෂක ප්‍රචාරක කාර්යාල පිහිටුවීම පිළිබඳ විධිවිධාන ඇතුළත් වී නොමැත. එසේ වුවද මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වල දී නිවේදිත ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට අනුමැතිය ලබා දී ඇති අතර, අපේක්ෂකයන්ගේ ප්‍රචාරණ අවශ්‍යතාව සලකා බලා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මගින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට සහ අදාළ පොලිස් ස්ථානයට දන්වා පිහිටවනු ලබන නිවේදිත ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට මැතිවරණ කොමිෂන් සභාව අවසර ලබා දී ඇත.

03. තරග කරන සෑම පක්ෂයකටම/ කණ්ඩායමකටම එක් පළාත් පාලන ආයතනයක් සඳහා එක් නිවේදිත මධ්‍ය කාර්යාලයක් පිහිටුවිය හැකි ය.

04. යම් පළාත් පාලන ආයතනයකට තරග කරන එක් පක්ෂයක් හෝ කණ්ඩායමක් සඳහා එක් කොට්ඨාසයකට එක් නිවේදිත කොට්ඨාස කාර්යාලයක් පමණක් පෞද්ගලික ස්ථිර ගොඩනැගිල්ලක පිහිටුවීමට අවසර ලබා දෙනු ලැබේ. ඒ සඳහා ඉල්ලීම් බලයලත් නියෝජිතයා විසින් එනම් ස්වාධීන කණ්ඩායමක් නම් කණ්ඩායම් නායකයා විසින් ද පක්ෂයක් නම් පක්ෂ ලේකම් හෝ ලේකම් විසින් පත්කරන ලද බලයලත් නියෝජිත විසින් ද ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යාල එක් අපේක්ෂකයකු සඳහා පමණක් වෙන් කරන ලද කාර්යාලයක් නොවන බවත් අදාළ පක්ෂය හෝ කණ්ඩායම වෙනුවෙන් වෙන්කරන ලද කාර්යාලය බවත් අවධාරණය කරනු ලැබේ. බහු සභික කොට්ඨාසයක දී පමණක් සුවිශේෂී අවස්ථාවක් සේ සලකා අදාළ සභික සංඛ්‍යාවට සමාන කාර්යාල සංඛ්‍යාවක් පිහිටුවිය හැකි අතර, ඒ සඳහා වෙන වෙනම අනුමැතිය ලබා දිය යුතු ය.

05. නිවේදිත මධ්‍ය කාර්යාලවල පක්ෂයේ නම, සලකුණ, පක්ෂ නායකයාගේ රුව හා අවශ්‍ය නම් සියලුම අපේක්ෂකයන්ගේ රුව සහිත එක් ප්‍රචාරක පුවරුවක් පමණක් ප්‍රදර්ශනය කළ හැකි ය. එමෙන්ම එක් කොට්ඨාස කාර්යාලයක් තුළ පළාත් පාලන ආයතනයට තරග කරන අපේක්ෂකයන්ගේ ඡායාරූප


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
*E-mail: comelesl@sltnet.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
*e-mail: cge@elections.gov.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස්(නීති)
மேலதிகத் தேர்தல்கள் ஆணையாளர் (சட்டம்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868448
*e-mail: electionlegal@gmail.com*

පමණක් සහිත පුවරුවක් ප්‍රදර්ශනය කළ හැකිය. එකී කාර්යාල පිහිටි භූමිය සැරසිලි කිරීම ගැන විරුද්ධත්වයක් නොමැත්තේ වුවද කිසිදු විටක මහා මාර්ගය හරහා හෝ මාර්ගය මත, පදික වේදිකාවේ හෝ විදුලි රැහැන්/ දුරකථන රැහැන් හෝ ඒවායේ කණුවල මෙයට අදාළ සැරසිලි කිරීම නොකළ යුතු වේ.

06. රජයේ නිල නිවාසවල හෝ ආගමික පූජනීය ස්ථානවල හෝ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට අවසර ලබා දිය නොහැකි බව දන්වා සිටිනු ලැබේ.

07. මෙම සියලුම කාර්යාලවල ද ප්‍රචාරක පුවරුව සවිකිරීමට හා කාර්යාල පරිශ්‍රය තුළ සැරසිලි කිරීමට ඉඩ දිය හැකි නමුත් එවැනි සියලුම කාර්යාලවල ප්‍රචාරක පුවරු හා සැරසිලි ඡන්ද විමසීමේ දිනට පැය 48 කට පෙර ඉවත් කළ යුතු ය.

08. නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම් දීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් තුනකින් (3) සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී නිර්දේශය ලබාගෙන අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් පරීක්ෂා කොට බලා කාර්යාල පිහිටුවීමට අදාළ අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන අනෙක් පිටපත් දෙක ඉල්ලුම්කරු වෙත ලබා දෙනු ඇත. එම පිටපත් දෙක දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් එනම් අදාළ පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර, තේරීම් භාර නිලධාරී විසින් ඉන් එක් පිටපතක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ රඳවා ගෙන ඉතිරි පිටපත ඉල්ලුම්කරු වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දෙනු ලබන අවසරය ඇතුළත් ලේඛනය සෑමවිටම කාර්යාල පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් හෝ තේරීම්භාර නිලධාරී විසින් යොදවා ඇති නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් පරීක්ෂා කළ හැකි අයුරින් ප්‍රදර්ශනය කළ යුතු වේ.

09. මෙම කිසිදු නිවේදිත කාර්යාලයක්, රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පිහිටුවිය නොහැකි ය. එසේ වුව ද ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති තවමත් රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව කාර්යාලයක් පැවැත්වීමට අවසර දෙනු ලැබේ.

10. (i) යම්කිසි පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක කාර්යාලයක, වෙනත් පක්ෂයක හෝ වෙනත් කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ පෝස්ටර්, කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම් ය. වෙනත් පක්ෂයක හෝ වෙනත් පක්ෂයක අපේක්ෂකයෙකුගේ ඡායාරූප/ නම්, ආවේනික වැකි ප්‍රදර්ශනය කරනු ලබන්නේ නම් එය අනවසර කාර්යාලයක් ලෙස සලකා ඉවත් කරනු ලබනු ඇති අතර, නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

(ii) යම් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නිවේදිත කාර්යාලයක පක්ෂයේ/ කණ්ඩායමේ අපේක්ෂකයකුගේ නම පමණක් ප්‍රදර්ශනය කළ නොහැකි අතර, එම පක්ෂයට/ කණ්ඩායමට අදාළ ඡන්ද ලකුණ, අපේක්ෂකයාගේ නම දැක්වෙන විශාලත්වයට සමාන ප්‍රමාණයෙන් ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම නියමය පනවනු ලබන්නේ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට අදාළ කාර්යාල හරහා වෙනත් පක්ෂ හා කණ්ඩායම්වල පක්ෂවල අපේක්ෂකයන්ගේ නම් ප්‍රචාරය කිරීම වැළැක්වීම පිණිස ය.

11. කිසිදු අවසරලත් නිවේදිත ප්‍රචාරක කාර්යාලයක්, තේරීම්භාර නිලධාරී කාර්යාල/ මැතිවරණ කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පොලිස් ස්ථාන වැනි සෘජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකි ය. එමෙන්ම රජයේ පාසල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබා ගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරතවන දරුවන්ට බාධාවන සේ රජයේ පාසල් ආසන්නයේම හෝ ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ස්වකීය නියෝජිතයන්, දැනුම්වත් කරන ලෙස සියලුම බලයලත් නියෝජිතයන් ස්වාධීන කණ්ඩායම්

නායකයන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. කෙසේ වුවද, රාජ්‍ය ආයතනවල හෝ පාසල්වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවන කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

12. මෙවැනි නිවේදිත ප්‍රචාරක කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබදය ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ශබ්දවාහිනී යන්ත්‍ර/ මෙගා ෆෝන් භාවිතා කිරීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස් කිරීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහය ලබා දිය යුතු ය. ඔවුනට බාධා කිරීම ඡන්ද විමසීම පැවැත්වීමට බාධා සිදු කිරීමක් සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

13. මෙම නියම කිරීම් හේතුවෙන් පූර්ව ඡන්ද විමසීම්වල දී කලක් තිස්සේම දේශපාලන පක්ෂ කාර්යාලයක් ලෙස පවත්වනු ලබන ස්ථානවල ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇති වන්නේ නම් හා කොට්ඨාසය තුළ ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් නැතිනම් ඒ සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කොට විකල්ප ස්ථානයක් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා ගත හැකි ය.

14. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ඡන්ද විමසීම් හා සැබැඳි ආරවුල්, පහරදීමේ, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇතිවිය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ස්ථාපිත කිරීම පිණිස බව අවධාරණ කරනු ලැබේ.

15. මෙම නියමයන් අවස්ථාවෝචිතව සංශෝධනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පවතින බව ද, එසේ කරණු ලබන යම් වෙනසක් වෙතොත් එය චක්‍රලේඛ මගින් දැනුම් දීමට ක්‍රියා කරනු ඇත.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :-
1. පොලිස්පති - දැන ගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට කාරුණික වනු පිණිස
2. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්
   - දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස
3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) -
   - දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස
4. නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් -
   දැනගැනීම සඳහා සහ බලයලත් නියෝජිතයන් දැනුම්වත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපතක් ලබා දීමට සහ ඉල්ලීම් කරන අවස්ථාවන් හී දී නියමිත වර්ණයෙන් යුත් අයදුම්පත්‍ර ලබා දීම සඳහා ක්‍රියා කිරීමට සහ අනුමැතිය ලබා ගැනීමේ ආකෘති පත්‍රවල කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරී වාර්තාව ලබා දීමේදී මෙහි සඳහන් කරුණු පිළිබද සැලකිලිමත් වන ලෙස ග්‍රාම නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැන ගැනීම සඳහා
6. මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන් -
   කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

ආකෘති අංක 1

| පිළිගත් දේශපාලන පක්ෂ ලේකම් / බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් මෙම ඉල්ලීම කළ යුතු ය. |
|---|

> මෙම ආකෘතිපත්‍රය පිටපත් තුනකින් සම්පූර්ණ කළ යුතු අතර, එම පිටපත් තුනෙහිම ග්‍රාම නිලධාරී සහතිකය සටහන් තබා ගත යුතු වේ. ඉන්පසු පිටපත් තුනම පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර, එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන පොලිසියේ නිර්දේශය සහිත පිටපත් දෙකක් ආපසු ලබා දෙනු ඇත. එම පිටපත් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ඉදිරිපත් කළ විට, තේරීම්භාර නිලධාරී සටහන් සහිත එක් පිටපතක් ඉල්ලුම්කරුට නිකුත් කරනු ඇත. එය නිවේදිත මධ්‍ය කාර්යාලයේ තබා ගත යුතු ය.

පළාත් පාලන ආයතනය.............................................................................
.............................................................................
(පක්ෂ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක / බලයලත් නියෝජිත )

ලිපිනය : .............................................................................

.............................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටුවෙහි ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

2025........................

**තේරීම්භාර නිලධාරී, .............................................................................**

*(පළාත් පාලන ආයතනයේ නම)*

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ............................

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| කොට්ඨාසයේ අංකය | කොට්ඨාසයේ නම |
| | |

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025
## නිවේදිත ප්‍රචාරක කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය : **නිවේදිත මධ්‍ය කාර්යාලය**

2. පක්ෂය/ ස්වාධීන කණ්ඩායම : .............................................................................

3. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ හිමිකාරත්වය පිළිබඳ තොරතුරු

3.1 ලිපිනය : .............................................................................
.............................................................................

3.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .............................................................................

3.3. එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..............................................

3.4. එම ස්ථානයේ හිමිකාරිත්වය

(මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)

3.4.1 හිමිකරුගේ නම : .............................................................................

3.4.2 ජාතික හැඳුනුම්පත් අංකය : .............................................................................

3.4.3 හිමිකරුගේ තැපැල් ලිපිනය : .............................................................................
.............................................................................

3.4.4 හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා අත්සන : ..............................................................

3.4.5 හිමිකරුගේ දුරකථන අංක : නිවස - ................................... ජංගම - ......................................

4. ප්‍රකාශය

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ......................................... නැමති පක්ෂය/ස්වාධීන කණ්ඩායම සඳහා නිවේදිත මධ්‍ය කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයට හෝ රාජ්‍ය ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙකී ඉඩම්/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා ඡන්ද විමසීම් නීති උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී ස්ථානයේ ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

.............................................................................
(පක්ෂ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක / බලයලත් නියොජිත අත්සන ) නිල මුද්‍රව

දිනය : 2025 ....................

---

## කාර්යාල පිහිටුවන ස්ථානයට අදාළ වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

.................................
.................................

මෙම කාර්යාලය පිහිටුවීමට අදාළ ස්ථානයේ ලිපිනය ............................................... වන බවත්, එම ස්ථානය කිසිදු රජයේ ආයතනයකට/ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටුවෙහි සඳහන් දුර සීමා තුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

................................................ නිල මුද්‍රාව
ග්‍රාම නිලධාරී අත්සන
දිනය : 2025..........................

(දෙවන පිටුව බලන්න)

# නිවේදිත මධ්‍ය කාර්යාලය

**අදාළ පොලිස් ස්ථානාධිපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

**මෙම කාර්යාලය පිහිටුවීම පිළිබඳ ගැටළුවක් ඇත්නම්, වහාම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් විමසන්න**

තේරීම්භාර නිලධාරී
........................................ දිස්ත්‍රික්කය/සභාව

.................................................................... නැමති දේශපාලන පක්ෂය/............................................................................................ගේ නායකත්වයෙන් යුත් ස්වාධීන කණ්ඩායම (අංකය ........., සලකුණ .....................) .........................................................සභාව සඳහා තරග කරන බැවින්, එම පක්ෂය/ කණ්ඩායම වෙනුවෙන් පසුපිටුවෙහි තොරතුරු සඳහන් ස්ථානයේ නිවේදිත මධ්‍ය කාර්යාලය පවත්වාගෙන යාම පිළිබඳව විරුද්ධත්වයක් නොමැත.

.....................................................................
පොලිස් ස්ථානාධිපතිගේ අත්සන — නිල මුද්‍රාව
පොලිස් ස්ථානය, .................................................
දිනය : .........................................

---

**මැතිවරණ කාර්යාලයේ නිසි බලධරයකු විසින් සම්පූර්ණ කළ යුතු ය.**

පසුපිටේ සඳහන් පක්ෂයේ /කණ්ඩායමේ නිවේදිත මධ්‍ය කාර්යාලය පිහිටුවීමේ
නිවේදනය භාරගන්නා ලදී.

..................................................
තේරීම්භාර නිළධාරී
........................................ දිස්ත්‍රික්කය/සභාව
දිනය : 2025....................... — නිල මුද්‍රාව

---

## උපදෙස් :

1. ඡන්ද විමසීම් නීතිය අනුව පක්ෂ/ අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ හැක්කේ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන ස්ථානයක පමණක් නමුත්, මෙම නිවේදිත මධ්‍ය කාර්යාලවල පක්ෂයේ නම, සලකුණ, පක්ෂ නායකයාගේ රුව හා අවශ්‍ය නම් සියළුම අපේක්ෂකයන්ගේ රුව සහිත එක් ප්‍රචාරක පුවරුවක් පමණක් ප්‍රදර්ශනය කළ හැකි ය. එකී කාර්යාලය පිහිටි භූමිය සැරසිලි කිරීම ගැන විරුද්ධත්වයක් නැත. එසේ වුව ද කිසිදු විටක මහ මාර්ගයේ, පදික වේදිකාවේ හෝ විදුලි රැහැන් /දුරකථන රැහැන් හෝ ඒවායේ කණුවල මෙයට අදාළ සැරසිලි කළ නොහැක.

2. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලය | තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්/ස්වාධීන කණ්ඩායම් නායකයන්/ බලයලත් නියෝජිතයන් පළාත් පාලන ආයතනයකට එක බැගින් | **අනුමැතිය ලද දින සිට ආරම්භ කළ හැකි අතර, ප්‍රචාරක පුවරු, දැන්වීම් සැරසිලි 2025.05.03 දින මධ්‍යම රාත්‍රියෙන් පසු ඉවත් කළ යුතු ය.** |

4. කිසිදු අවසරලත් ප්‍රචාරක කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි ඍජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකි ය.

5. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ලේකම්වරුන්/ කණ්ඩායම් නායකයන් හා ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතනවල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

6. මෙවැනි යම් කාර්යාලයක් හේතුවෙන් මාර්ග තදබදයක් හෝ මහජනයාට අවහිරවීමක් හෝ අපහසුතා ඇතිවීමක් සිදුවුවහොත් එම කාර්යාලය පිහිටුවීමේ අවසරය ඉවත් කරනු ලැබේ.

ආකෘති අංක 2

පිළිගත් දේශපාලන පක්ෂ ලේකම් / බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් මෙම ඉල්ලීම කළ යුතු ය.

පිටපත් තුනකින් සම්පූර්ණ කළ යුතු අතර, එම පිටපත් තුනෙහිම ග්‍රාම නිලධාරී සහතිකය සටහන් තබා ගත යුතු වේ. ඉන්පසු පිටපත් පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර, එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන පොලිසියේ නිර්දේශය සහිත පිටපත් දෙකක් ආපසු ලබා දෙනු ඇත. එම පිටපත් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ඉදිරිපත් කළ විට, තේරීම්භාර නිලධාරී සටහන් සහිත එක් පිටපතක් ඉල්ලුම්කරුට නිකුත් කරනු ඇත. එය නිවේදිත කොට්ඨාස කාර්යාලයේ තබා ගත

පළාත් පාලන ආයතනය............................................................

...........................................................................

(පක්ෂ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක/බලයලත් නියෝජිත )

ලිපිනය : ...........................................................................

...........................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටුවෙහි ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

2025........................

තේරීම්භාර නිලධාරී, ...........................................................................

*(පළාත් පාලන ආයතනයේ නම)*

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, .................................. (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| කොට්ඨාසයේ අංකය | කොට්ඨාසයේ නම |
| | |

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025
## නිවේදිත ප්‍රචාරක කාර්යාල පිහිටුවීම

***පක්ෂය/ ස්වාධීන කණ්ඩායම් සඳහා කොට්ඨාසයක් වෙනුවෙන් පිහිටුවන නිවේදිත කොට්ඨාස කාර්යාලය***

1. පක්ෂය/ස්වාධීන කණ්ඩායම : ...........................................................................
2. බලයලත් නියෝජිතයාගේ/ ස්වාධීන කණ්ඩායමේ නායකයාගේ නම : ...........................................................................
3. කාර්යාලය පිහිටුවීමට අපේක්ෂිත කොට්ඨාසයේ අංකය හා නම : ...........................................................................
4. කාර්යාලය පිහිටුවන ස්ථානයේ ලිපිනය : ...........................................................................
5. අදාළ ස්ථානයේ හිමිකාරිත්වය :

   (මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)

   5.1 ඉහත ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ...........................................................................

   5.2 ස්ථානයේ හිමිකරුගේ නම : ...........................................................................

   5.3 හිමිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................................

   5.4 හිමිකරුගේ තැපැල් ලිපිනය : ...........................................................................

   5.5 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................... ජංගම - ....................................

   5.6 හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා අත්සන : ...........................................................................

6 **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිවේදිත කොට්ඨාස කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයට හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් කොට්ඨාස කාර්යාලයක් පිහිටුවීම සඳහා හිමිකරුගේ විධිමත් අයිතිය ලැබී ඇති බවත් ප්‍රකාශ කරමි. සාමාන්‍ය නීතිය හා ඡන්ද විමසීම් නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත්, ඉහත කී ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

...........................................................

(පක්ෂ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක / බලයලත් නියෝජිත අත්සන ) නිල මුද්‍රාව

දිනය : ................................

---

## කාර්යාල පිහිටුවන ස්ථානයට අදාළ වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය

.........................................

.........................................

මෙම කාර්යාලය පිහිටුවීමට අදාළ කොට්ඨාස අංකය හා නම........................................................................ වන බවත්, එම ස්ථානයේ කාර්යාලයක් පිහිටුවීමට හිමිකරුගේ එකඟතාව ලැබී ඇති බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ ලේකම් කාර්යාල , ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටුවෙහි සඳහන් දුර සීමා තුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

........................................................ නිල මුද්‍රාව

ග්‍රාම නිලධාරී අත්සන

දිනය......................

දෙවැනි පිටුව බලන්න

## පක්ෂ /ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් පිහිටුවන නිවේදිත කොට්ඨාස කාර්යාලය

**අදාළ පොලිස් ස්ථානාධිපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

තේරීම්භාර නිලධාරී
........................................ දිස්ත්‍රික්කය/සභාව

**මෙම කාර්යාලය පිහිටුවීම පිළිබඳ ගැටළුවක් ඇත්නම්, වහාම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් විමසන්න**

.............................................................. නැමති දේශපාලන පක්ෂය/.......................................................................ගේ නායකත්වයෙන් යුත් ස්වාධීන කණ්ඩායම (අංකය ........., සලකුණ .....................) ..................................................සභාව සඳහා තරග කරන බැවින්, එම පක්ෂය/ කණ්ඩායම වෙනුවෙන් පසුපිටුවෙහි තොරතුරු සඳහන් ස්ථානයේ නිවේදිත මධ්‍ය කාර්යාලය පවත්වාගෙන යාම පිළිබඳව විරුද්ධත්වයක් නොමැත.

..............................................................
පොලිස් ස්ථානාධිපතිගේ අත්සන

නිල මුද්‍රාව

පොලිස් ස්ථානය, ..................................................
දිනය : ..........................................

---

**මැතිවරණ කාර්යාලයේ නිසි බලධරයකු විසින් සම්පූර්ණ කළ යුතු ය.**

පසුපිටේ සඳහන් පක්ෂයේ /කණ්ඩායමේ නිවේදිත කොට්ඨාස කාර්යාලය පිහිටුවීමේ
නිවේදනය භාරගන්නා ලදි.

...................................................
තේරීම්භාර නිළධාරී
........................................ දිස්ත්‍රික්කය/සභාව
දිනය : 2025.........................

නිල මුද්‍රාව

---

**උපදෙස් :**

1. ඡන්ද විමසීම් නීතිය අනුව පක්ෂ/අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ හැක්කේ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන ස්ථානයක පමණක් නමුත් මෙම නිවේදිත කොට්ඨාස කාර්යාලවල පක්ෂයේ නම, සලකුණ, අවශ්‍ය නම් අපේක්ෂකයන්ගේ රුව සහිත එක් ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කළ හැකි ය. එකී කාර්යාලය පිහිටි භූමිය සැරසිලි කිරීම ගැන විරුද්ධත්වයක් නැත. එසේ වුව ද කිසිදු විටක මහා මාර්ගයේ, පදික වේදිකාවේ හෝ විදුලි රැහැන් /දුරකථන රැහැන් හෝ ඒවායේ කණුවල මෙයට අදාළ සැරසිලි කළ නොහැක.
2. පොලීසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතු ය .එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ නිවේදිත ශාඛා කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
3. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | |
|---|---|
| **පළාත් පාලන ආයතනයක කොට්ඨාසයක් සඳහා නිවේදිත කාර්යාලයක් (කොට්ඨාස කාර්යාලය)** | **අනුමැතිය ලද දින සිට ආරම්භ කළ හැකි අතර, ප්‍රචාරක පුවරු, දැන්වීම් සැරසිලි 2025.05.03 දින මධ්‍යම රාත්‍රියෙන් පසු ඉවත් කළ යුතු ය.** |

4. පළාත් පාලන ආයතනයක එක් කොට්ඨාසයක් සඳහා තරග කරන එක් පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට එක් නිවේදිත කොට්ඨාස කාර්යාලයක් පමණක් පිහිටුවිය හැකි ය.
5. කිසිදු අවසරලත් නිවේදිත කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි සෘජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකි ය.
6. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ලේකම්වරුන්ගෙන්/ කණ්ඩායම් නායකයන්ගෙන් හා ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතනවල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන නිවේදිත ශාඛා කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.
7. මෙවැනි යම් කාර්යාලයක් හේතුවෙන් මාර්ග තදබදයක් හෝ මහජනයාට අවහිරවීමක් හෝ අපහසුතා ඇතිවීමක් සිදුවුවහොත් එම කාර්යාලය පිහිටුවීමේ අවසරය ඉවත් කරනු ලැබේ.